# ලංකාවෙ යුද්ධයක් තිබුණු බවවත් දැන් හුඟදෙනෙකුට මතක නැතිවෙලා

## - ජෙනරාල් සරත් ෆොන්සේකා වොෂිංටන් විහාරයේදී කියයි



**මේ** නොබෝදා ඇමරිකාවේ කිසියම් කටයුත්තකට ගිය හිටපු හමුදා ආඥාපති ජෙනරාල් සරත් fපොන්සේකා මහතා වොෂිංටනයේ බෞද්ධ විහාරයට ද යාමට අමතක නොකළේ ය. එහි රැස්ව සිටි ශ්‍රීලාංකික පිරිස සහ සංඝයා වහන්සේලා අභියස ඒ මහතා කළ කථාව ඒ අයුරින්ම මෙසේ දක්වමු.

මේ සියළු දෙනාම බලාපොරොත්තුවන, පළමුවෙනි වතාවට මේ පන්සලකදි කතාකරන්නෙ. වැරදි තිබුණොත් සමාවෙන්න.

දැනට රටේ තියන තත්වය අනුව ධර්මසිරි හාමුදුරුවො ඉතා පැහැදිලි අර්ථකථනයක් කළා වෙච්ච දේ මොකක්ද ඉදිරියට විය යුත්තේ මොකක්ද කියලා. මම ගිය පාර ඇමරිකාවට ආපු වෙලාවෙ පොරොන්දුවක් දුන්නා මේ අවුරුද්දෙ දෙදාස් නමයෙ යුද්දෙ ඉවර කරනවයි කියලා. අපිට ඒ පොරොන්දුව නැවත මේ ස්ථානයට එන්න ප්‍රථම ඉෂ්ට කරන්න හම්බවීම ගැන, මේ අවුරුද්දෙ මැයි මාසෙ මැයි 18 වෙනිදා ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න ලැබීම ගැන අපි සතුටු වෙනවා. ඒ පොරොන්දුව අපි එදා දුන්නෙ ත්‍රස්තවාදෙ ඉවර කරලා අපේ රටේ මතු පරම්පරාවට ආරක්ෂා සහිතව ජීවත්වෙන්න පුළුවන් රටක් ඇති කරනවයි කියලා. අපි හුඟක් කැපවීමෙන් වැඩ කළා, හුඟක් මහන්සිවෙලා. ඒක බොහොම පහසුවෙන් ලබපු ජය ග්‍රහණයක් නෙවෙයි, හුඟක් ධෛර්‍යවන්තව අධිෂ්ඨාන යක් ඇතුව වැඩ කරලයි ඒ ජයග්‍රහණය ලබාගත්තෙ.

සමහර වෙලාවට ලංකාවෙ හුඟක් අයට පේනවා ඒක බොහොම පහසුවෙන් ලබාගත්තු එකක් හැටියට. ඒ ජයග්‍රහණය බෙදාගන්න හදනවා. ජයග්‍රහණය ගැන කතාකරනවා. නමුත් ඒ ජයග්‍රහණය ගැන හුඟක් දන්නේ ඒ සටනේ යෙදිලා හිටපු අය. කොච්චර දුෂ්කරතා මධ්‍යයේද අපි ඒක ලබාගත්තෙ කියලා.

විශේෂයෙන් යුද හමුදාව, මම දැනට ත්‍රිවිධ හමුදාවට අවේණික රාජකාරියක් කරතත්, යුද හමුදාව කරපු කැපවීම ගැන තෝරලා නොකීවොත් මම මගේ රාජකාරිය පැහැර හැරීමක් වෙනවා. යුද හමුදාවෙ 5200 ක් සෙබළු මැරිලා, 28,000 ක් තුවාල වෙලා අප ලත් ජයග්‍රහණයක්. ඒ කැපවීම ගැන යුද හමුදා අණදුන් නිලධාරියා හැටියට එ වෙලාවෙ ඒ හමුදාවෙ හිටපු අයට අප ණය ගැතියි.

ඒ හමුදාවෙ ඒ හිටපු අය ඒ කැපවීම් නොකරන්න මේ ජයග්‍රහණය අපට ලබන්න හම්බවෙන්නෙ නැහැ. ඉතින් ඒ නිසා මගේ ප්‍රණාමය කතාකරන හැම වෙලාවකම මම ඔවුන්ට පුදකරනවා.

යුද හමුදාවට ඒ කාලෙ ලක්ෂයක් ආධුනිකයො බැඳුණා. ඒ ආධුනිකයො නොබැඳෙන්න අප තවම සමහර වෙලාවට වවුනියාවෙ හරියෙ තමයි. ඉදිරියට යන්න හම්බවෙන්නෙ නැහැ. අපට මහජනතාව දක්වපු ගෞරවය සහයෝගය හන්ද තමයි මෙවැනි සංඛ්‍යාවක් බැඳුණේ. ඒ ආධුනිකයන්ගෙන් තවම 80000ක් පමණ අපි එක්ක ඉන්නවා. 20000ක් විතර මං හිතන්නෙ නිවාඩු නැතිව යන්න ඇති. නමුත්



ඒ බැඳුණ සෙබළු සහ මහජනතාව දුන් සහයෝගය නොවන්න අපි කොච්චර දක්ෂ හමුදාපතිවරු වුනත්, කොතරම් දක්ෂ දේශපාලකයො වුනත් මේ ශක්තිය මේ ජයග්‍රහණය නොලැබෙන්න තිබුණා. හැබැයි මීට ඉස්සරත් හමුදාවට සෙබළුන් බඳවාගන්න අවශ්‍යතාව තිබුණා. නමුත් අවුරුද්දකට 3000 ක් වත් බඳවා ගන්න බැරිවුණා.

මේ අවස්ථාවේ අවුරුද්දකට 40,000 ගාණේ සෙබළුන් හමුදාවට බැඳුණා. ඒකත් අපට ලොකු ජයග්‍රහණයක් කියලා අපි හිතනවා. මේ ජයග්‍රහණයෙන් අපි බලාපොරොත්තු විය යුත්තේ ප්‍රභාකරන් මැරුණා කියලා සියල්ල සම්පූර්ණයි කියලා හිතලා විනෝදවෙන එක නෙවෙයි, ඉස්සරත් ප්‍රභාකරන් කෙනෙක් හිටියෙ නෑ. ප්‍රභාකරන් කෙනෙක් ඇතිවුණා අවුරුදු 30 කට ඉස්සෙල්ලා. ඒ මුල අමතක වුණු ලාංකිකයින්ට මේ අවුරුදු තිහේ අපි විඳපු දුක, මුණදීපු තත්වය, ඒ තත්වයෙන් ගොඩ එන්න අපි කොච්චර මහන්සි වුණාද, කොච්චර කැපවීම් කළාද කියලා අමතක කළොත් මේ පරම්පරාවෙ නැතිවුනත් ඊළඟ පරම්පරාවට අනිවාර්යයෙන්ම නැවත ප්‍රභාකරන්ලා මුණගැහෙන බව මට විශ්වාසයි.

ඒක හින්දා මේ අවස්ථාවෙ නායක හාමුදුරුවො කිව්වා වගේ, අපි එකමුතුව ඉන්න ඕන. එකමුතුකම රැකගැනීම අවශ්‍යයි. එකමුතුව සිටීමට නම් සියළු දෙනාම අවංකව තම තමන්ගෙ පැත්තෙන් මේ ප්‍රශ්නය දිහා බලලා සාධාරණව වැඩ කළොත් එකමුතු වෙනවා වගේම මංහිතනවා අපට මේ රට රැකගන යන්න පුළුවන් කියලා.

නමුත් සමහර අවස්ථාවල අපට පේනවා, දැනටම හමුදාවෙ වටිනාකම අමතක වෙලා කොළඹ ඉන්න සමහර අයට. දැනටම හමුදාව කරපු දේ ඉතා සුළුවෙන්, වාසනාවට ස්වීප් ටිකට් එකක් ඇදෙන්න වගේ ලැබුණු දෙයක් කියා කතා කරන, හිතන අයත් ඉන්නවා. ඒ අයත් රටේ වගකීම් දරන අය. ඒ අයත් තේරුම් ගත්තොත් කොච්චර අමාරුවෙන්ද කොච්චර කැපවීමක් කරලද කියලා, එතකොට තමයි මේ ජයග්‍රහණය ඇත්ත ප්‍රතිපල ලබාගන්න පුළුවන් වන්නෙ.

අපෙන් වෙන්න තියන රාජකාරිය හැමදාම කරනවා. යුනිපෝම් ඇඳලා ජෙනරල්ලා හැමදාම හමුදාවෙ ඉන්නෙ නෑ. මම දැන් විශ්‍රාම යන වයසත් පහු කරලා අවුරුදු හතරක් හමුදාවෙ. මම හිතන්නෙ නෑ රටේ සියල්ල සම්පූර්ණය කියලා තාම. යුද්දෙන් ප්‍රභාකරන් මරපු පමණින් රටේ ආරක්ෂාව සීයට සීයක් සහතිකවෙලා නැහැ. ඩිස්ප්ලේස් පීපල් අස්ථානගත වෙච්ච පුද්ගලයින් නැවත පදිංචි කරවලා, ඒ පැතිවලට ආරක්ෂාව අවශ්‍ය ප්‍රමාණයට හමුදාව යොදවලා, ඒ මිනිස්සු ඉන්න කඳවුරුවල තවමත් දහස් ගණනක් ත්‍රස්තවාදීන් ඉන්නවා. මේ විෂබීජ. ඒත්‍රස්තවාදීන් හඳුනාගෙන, ඔවුන් විනාශකරලා, අත්අඩංගුවට අරගෙන, අස්ථාන ගතවූ අය නැවත පදිංචි කරවලා, ශක්තිමත් ලෙස ඒ ප්‍රදේශවලට ආරක්ෂාව සැපයුවොත් තමයි දිනපු යුද්දෙ අවසානයක් දැක්කයි කියලා අපට සතුටුවෙන්න පුළුවන්. අපි ඒ අරමුණ කරා යා යුතුයි.

සමහර විට මේ යුනිපෝම් එක මං වගේ අයට අනාගතයේදි ගලවන්න වෙයි. ජීවත්වෙනතාක් කල් හැමදාම මේක ඇඳගෙන ඉන්න බෑ. හැබැයි එහෙම වුනත් රටේ ආරක්ෂාවට ගතයුතු පියවර ගන්න මම නම් කිසිසේත් පසුබට වෙන්නෙ නෑ. රටේ ආරක්ෂාවට ගතයුතු පියවරක් ඇත්නම් ඒක ගන්න එක අපේ යුතුකම රටවැසියන් හැටියට.

ලබපු ජයග්‍රහණයෙන් උදම් අන අනා විනෝදයෙන් කාලය ගෙවන එකට වඩා ඉදිරියේ මොකද වෙන්නෙ කියලා අවධානයෙන් ඉඳීමයි කළ යුතු. ඒ බව සිතේ ධාරණය කරගෙන ඔබ සැම යුද්ධය තියෙන කාලෙ රට ගැන හිතුව වගේම ඉදිරියටත් රට ගැන හිතන්න කියලා මම ඉල්ලනවා. රට හරිපැත්තට යනවද, නිසි අයුරින් නිසි මාර්ගයට ගෙන යනවද, රටට ආරක්ෂාව සැපයිය යුතු අය ආරක්ෂාව සපයනවද කියලා ඒ අංශයෙන් අවධාරණය කරලා ඔබ රට වෙනුවෙන් සේවයක් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ශිෂ්‍යත්ව ප්‍රදානය ගැන මම අවධාරණයෙන් සඳහන් කළ යුතුයි. ඔබ ඒ ගැන දක්වන උනන්දුව තුළ අපි ධෛර්‍යමත් වෙනවා. ඒ ගැන අපි ඔබට ප්‍රශංසා කරනවා. නැවතත් ස්තුති වන්ත වෙනවා මට මේ අවස්ථාව ලබාදීම ගැන.

Duke's Court Travel
DUKE'S COURT TRAVEL
Fly to Colombo
SriLankan Airlines fr £330 + Taxes
Qatar Airways fr £193 + Taxes
Kuwait Airways fr £290 + Taxes
Emirates fr £350 + Taxes
Kingfisher Airlines fr £310 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
www.easy-flights.tv
020 8748 3535 / 0800 112 0535
IATA
204 King Street, London W6 0RA

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න
FAST CASH
SEND TODAY - COLLECT TODAY
Transfer Fees From only £5
FREE Money Transfer for You + Friend
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
COMMERCIAL BANK BOC HNB HSBC MCG Standard Chartered සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK
www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

